# මූලික සටහන් පොත්

Primary Entry Books



දේශක,

**Deeptha Ekanayaka**

*BSc.(Special) in Business Administration*
*University of Sri Jayewardenepura*

1. ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිවෙලින් නම් කරන්න.

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

2. ගනුදෙනු හඳුනා ගැනීමේදී සලකා බැලිය යුතු මූලික ගිණුම්කරණ සංකල්ප 02 නම් කරන්න.

........................................................................................................................
........................................................................................................................

3. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් කාණ්ඩ කීයක් යටතේ වර්ග කල හැකිද? එම ගනුදෙනු වර්ග 8 නම් කර එම ගනුදෙනු මුලින්ම වාර්තා කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලික පොත වෙන වෙනම නම් කරන්න.

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

4. ව්‍යාපාරයක පොදු ලෙජරය යන්න හඳුන්වා එහි ඇතුලත් වන ගිණුම් වර්ග මොනවාද? යන්න නම් කරන්න.

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

DEEPTHA EKANAYAKA

5. සමන්ත විසින් ව්‍යාපාරයේ 2024 මාර්තු 01 දින වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. තුල සිදුවූ ගනුදෙනු හා සිද්දීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ණයට ගැනුම් සම්බන්ධ විස්තර**

| | | |
|---|---|---|
| 03.02 | ඉන්.1 | කමල්ගෙන් රු.50000 ක භාණ්ඩ |
| 03.12 | ඉන්.2 | නිමල්ගෙන් රු.30000 ක භාණ්ඩ |
| 03.24 | ඉන්.3 | සුනිල්ගෙන් රු.45000 ක භාණ්ඩ |
| 03.30 | ඉන්.4 | සිරිල්ගෙන් රු.65000 ක භාණ්ඩ |

**ණයට විකුණුම් සම්බන්ධ විස්තර**

| | | |
|---|---|---|
| 03.02 | ඉන්.1 | කමිඳුට රු.70000 ක භාණ්ඩ |
| 03.15 | ඉන්.2 | සුරනිමලට රු.80000 ක භාණ්ඩ |
| 03.24 | ඉන්.3 | සුපිපිට රු.100 000 ක භාණ්ඩ |
| 03.31 | ඉන්.4 | කුසුමාට රු.150000 ක භාණ්ඩ |

**ආපසු එවුම් සම්බන්ධ තොරතුරු**

| | | |
|---|---|---|
| 03.03 | බැර.1 | කමිඳු රු.7000 ක භාණ්ඩ |
| 03.16 | බැර.2 | සුරනිමල රු.8000 ක භාණ්ඩ |
| 03.25 | බැර.3 | සුපිපි රු.7000 ක භාණ්ඩ |
| 03.31 | බැර.4 | කුසුමා රු.5000 ක භාණ්ඩ |

**ආපසු යැවුම් සම්බන්ධ තොරතුරු**

| | | |
|---|---|---|
| 03.03 | හර.1 | කමල්ට රු.5000 ක භාණ්ඩ |
| 03.16 | හර.2 | නිමල්ට රු.2000 ක භාණ්ඩ |
| 03.25 | හර.3 | සුනිල්ට රු.4500 ක භාණ්ඩ |
| 03.31 | හර.4 | සිරිල්ට රු.5000 ක භාණ්ඩ |

අනෙකුත් තොරතුරු,

I. 03.01ව්‍යාපාරය ආරම්භ කිරීම සඳාහා මුදල් යෙදවීම රු. 400 000කි. තවද රු.50000 ගෘහ භාන්ඩද, රු.800000 ක් වටිනා ගොඩනැඟිල්ලක්ද යොදවන ලදි.
II. 03.04 යන්ත්‍රයක් මිලදී ගැනීම රු.100 000කි.
III. 03.07 අත්පිට විකුණුම් රු. 60000කි.
IV. 03.10 අත්පිට ගැණුම් රු.20000කි.
V. 03.12 නිමල්ට රු.20000 ක ණය සඳහා 10%ක වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.
VI. 03.14.කමිඳුගේ ණය මුදලට 5%ක වට්ටමකට යටත්ව මුදල් ලැබීම.
VII. 03.16 කුසුමාගේ ණය මුදලින් රු.3000 ක් බොල්ණයලෙස කාපාහැරීම.
VIII. 03.18 සුරනිමලගේ සම්පූර්ණ ණය මුදල සඳහා මුදල් ලැබීම.
IX. 03.21 කොමිස් ආදායමක් ලැබුණා රු.5000 කි.
X. 03.23 කුලී වියදමක් ගෙව්වා රු. 2500 කි.



DEEPTHA EKANAYAKA

XI. 03.25 අයිතිකරුගේ මුදල් ගැනිලි රු.5000 කි.
XII. 03.31 යන්ත්‍ර 5% ක් මාසික ක්ෂය කල යුතුය.

අවශ්‍ය වන්නේ,

1. අවශ්‍ය වන මූලික සටහන් පොත් කට්ටලය.
2. පොදු ලෙජරය ( පාලන ගිණුම් සහිතව)
3. ශේෂ පිරික්සුම.

6. **සුපිපිගේ ව්‍යාපාරයේ සුලු මුදල් සම්බන්ධ ගෙවීම් සඳහා වෙනම ජ'නලයක් පවත්වා ගෙන යනු ලබයි .මාසික සුළු මුදල් අග්‍රිමය රු. 5000 කි. පහත දැක්වෙන්නෙ එම ව්‍යාපාරයේ අප්‍රේල් මාසයේ සුළු මුදල් ගෙවීම් සම්බන්ධ විස්තර වේ.**
   - 4/1 සුළු මුදල් අග්‍රිමය සුළු මුදල් භාරකරුට ලබාදුන්නා.
   - 4/2 සංග්‍රහ හා ලිපි ද්‍රවය වියදම් පිලිවෙළින් රු. 100 ක් හා රු. රු. 200 කි.
   - 4/5 තැපැල් ගාස්තු ගෙව්වා රු. 50.
   - 4/6 ලිපි ද්‍රවය වියදම රු. 100.
   - 4/8 තේ කුඩු හා සීනි මිලදී ගත්තා රු. 250.
   - 4/9 සුනිල් ට රු. 120 ක් ගෙව්වා.
   - 4/15පිරිසිදු කිරීම් ද්‍රව්‍ය මිල දී ගත්තා රු. 140.
   - 4/16 සංග්‍රහ වියදම් රු. 150.
   - 4/20 පිරිසුදු කිරීමේ වියදම් රු. 150.
   - 4/21 තැපැල් ගාස්තු රු. 60.
   - 4/23 ලිපි ද්‍රවය වියදම් රු. 200
   - 4/25 සංග්‍රහ වියදම් රු. 100.
   - 4/27 විදුලි වියදම් ගෙව්වා රු. 100.
   - 4/30 සංග්‍රහ වියදම් රු. 70.
   - **ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින් සුළු මුදල් ජ'නලය පිළියෙල කර තොරතුරු ලෙජරයට පිටපත් කරන්න .**

7. සුපිපිගේ තොග වෙළෙඳ ව්‍යාපාරයේ 2023 අප්‍රේල් මාසය තුල සිදුවූ ගනුදෙනු සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. මෙම සුපිපිගේ ව්‍යාපාරය එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇත.(සියලුම ගැනුම් හා විකුණුම් VAT 10% වලට යටත් වේ)
   - 4/1 (ල.අ. 01) රු. 1000 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කරන ලද අතර,(ජ.ව.1) රු. 500 000 ක් වටිනා පියාජියෝ මෝටර් රථයක් ණය පදනම මත Vallibel finance ආයතනයෙන් ලබාගත්තා.
   - 4/2 (වච්චර් 01) රු. 20000 ක් වටිනා සහල් තොග අත්පිට මිලටගැනීම.

DEEPTHA EKANAYAKA

- 4/2 (වව්චර් 02) රු. 10000 ක් වටිනා කුළු බඩු තොග අත්පිට මිලටගැනීම.
- 4/3 (ලදුපත් 02) අරුනලුට රු. 5000 ක සහල් තොග අත්පිට විකිණීම විකිණීම.
- 4/5 (වි.Inv.1) අරලිය වෙළෙඳසැල වෙත රු. 30 000 ක සහල් තොග විකිණීම;.
- 4/6 (ගැ.Inv.1) සමන්ගෙන් රු. 60000 ක් වටිනා සහල් තොගයක් ගැනීම.
- 4/7 (වි.Inv.2) අරුනලුට රු. 10000ක කුළුබඩු තොගයක් විකිණීම.
- 4/8 (හර 01) සමන්ගෙන් ගත් රු.4000 ක් වටිනා සහල් තොග ආපසු යැවීම.
- 4/9 (ගැ.Inv.2) සුනිමල්ගෙන් 1kg ක් රු.400 බැගින් කරවල 100kg ක් මිලදීගත්තා එහිදී රු. 2000ක වෙලඳ වට්ටමක් ලැබුණා.
- 4/10 (වි.Inv.3) අරලිය වෙළඳසැල වෙත රු. 140 බැගින් රතු සහල් 200kg ක් විකිණුවා එහිදී දුන් වෙළෙඳ වට්ටම රු. 1000කි.
- 4/11 (ගැ.Inv.3) සමන්ගෙන් 1kg ක් රු.200 බැගින් බාස්මතී 100kg ක් මිලදීගත්තා එහිදී රු. 1000ක වෙලඳ වට්ටමක් ලැබුණා.
- 4/12 (වව්චර් 03) රු. 2000 ක් විදුලි බිල ගෙව්වා.
- 4/13 (වව්චර් 04)රු. 3000 ක ඉන්ධන වියදම් ගෙව්වා.
- 4/14(ගැ.Inv.4) පසිදු ගෙන් 1kg ක් රු.400 බැගින් තේ කොල 50kg ක් මිලදීගත්තා.
- 4/15(හර 2) සුනිමල්ට ආපසු යැවුම් රු.6000 කි.
- 4/16 (වව්චර් 05) රු. 8000 ක් වටිනා සීනි තොග අත්පිට මිලට ගැනීම.
- 4/17 ( වව්චර් 06) පසිදුට රු. 7000ක මුදල් ගෙව්වා.
- 4/20 (ලදුපත් 03) කුසුම්ට රු. 10000 ක සහල් තොග අත්පිට විකිණීම විකිණීම.
- 4/22 (ලදුපත් 04) සහන්ට රු. 20 000 ක කරවල තොග අත්පිට විකිණීම විකිණීම.
- 4/24 (ලදුපත් 05) අරුණලුගෙන් රු. 5000 ක මුදල් ලැබුණා. එහිදී 5%ක වට්ටම් ලබා දුන්නා.
- 4/25 (ලදුපත් 06) අරලිය ගෙන් රු. 12000 ක මුදල් ලැබුණා.
- 4/28 ( ලදුපත් 07) කොමිස් ආදායමක් ලැබුණා රු. 10 000කි.
- 4/29 (බැර 1) අරලිය රු. 3000 ක විකුණුම් මිල වූ සහල් ආපසු එවීම.
- 4/30 (බැර 2) අරුණලු රු. 2000 ක් වටිනා තොග ආපසු එවීම.

I. ඉහත තොරතුරු මූලික සටහන් පොත් වල සටහන් කර ලෙජරයට පිටපත් කරන්න.
II. ලෙජර් ගිණුම් තුලනය කර ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

DEEPTHA EKANAYAKA

8. සිසිල ව්‍යාපාර විසින් 2021 ජූලි මාසය තුළ ණයට ගැණුම් හා ආපසු යැවුම් ගනුදෙනු පහත දැක්වේ. මෙම ආයතනය එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නැත.

| | | |
|---|---|---|
| **7/1** | **ඉන්වොයිස් 01** | **එකක් රු 20 බැගින් ඒකක 300 ක් සාලියගෙන් ගත්තා.** |
| **7/3** | ඉන්වොයිස් 02 | එකක් රු 40 බැගින් මිල වූ භාණ්ඩ ඒකක 400 ක් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව ජාලියගෙන් ගත්ත. මේවට 12% VAT අයකර තිබුණා. |
| **7/8** | හරපත් 01 | සාලියට භාණ්ඩ ඒකක 50 ක් ආපසු යැව්වා. |
| **7/12** | ඉන්වොයිස් 03 | නිමාලිගෙන් රු.30000 ක වටිනා තොග මිලට ගැනීම. |
| **7/16** | හරපත් 02 | 7/3 දින ජාලියගෙන් ගත් භාණ්ඩ ඒකක 100 ක් ආපසු යැව්වා. |
| **7/20** | ඉන්වොයිස් 04 | ඒකකයක් රු 25 බැගින් ඒකක 800 ක් ජාලියගෙන් ගත්තා. |
| **7/25** | ඉන්වොයිස් 05 | ඒකකයක් රු 80 බැගින් ඒකක 200 ක් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව රජිතගෙන් ගත්තා. |
| **7/30** | හරපත් 03 | රජිතගෙන් ගත් භාණ්ඩ වලින් ඒකක 40 ක් ආපසු යැව්වා. |

අවශ්‍ය වන්නේ,

I. ගැණුම් ජ'නලය
II. ආපසු යැවුම් ජ'නලය
III. පාලන ගිණුම් පවත්වා ගෙන නොයන බව උපකල්පනය කරමින් ඉහත ජ'නල්වල සඳහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම.

9. ගම්ලත් සමගම විසින් 2021 ජූලි මාසය තුළ කරන ලද ණයට විකුණුම් හා ආපසු එවුම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| **7/2** | **ඉන්වොයිස් 01** | **ඒකකයක් රු 60 බැගින් භාණ්ඩ ඒකක 400 ක් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව අමාලිට විකුණුවා.** |
| **7/5** | ඉන්වොයිස් 02 | එකක් රු 80 බැගින් භාණ්ඩ ඒකක 300 ක් 20% ක වෙළඳ වට්ටමකට යටත්ව සුමනසිරිට විකුණුවා. |
| **7/10** | බැරපත් 01 | අමාලි විසින් භාණ්ඩ ඒකක 50 ක් ආපසු එව්වා. |
| **7/14** | බැරපත් 02 | සුමනසිරි විසින් භාණ්ඩ ඒකක 80 ක් ආපසු එව්වා. |

| | | |
|---|---|---|
| **7/16** | ඉන්වොයිස් 03 | වෙළඳ වට්ටම අඩු කළ මිල වූ රු 64 බැගින් භාණ්ඩ ඒකක 800 ක් ජයසිංහට විකුණුවා. |
| **7/19** | ඉන්වොයිස් 04 | වෙළඳ වට්ටම අඩු කළ මිල වූ රු 108 බැගින් භාණ්ඩ ඒකක 200 ක් සුමනසිරිට විකුණුවා. |
| **7/22** | බැරපත් 03 | 7/16 දින ජයසිංහට විකුණූ භාණ්ඩ වලින් ඒකක 100 ක් ආපසු එව්වා. |

අවශ්‍ය වන්නේ,

I. විකුණුම් ජ'නලය
II. ආපසු එවුම් ජ'නලය
III. පාලන ගිණුම් පවත්වා ගෙන නොයන බව උපකල්පනය කරමින් ඉහත ජ'නල්වල සඳහන් කළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරිම.

**10.සීමිත අරුණලු සමාගම සියලු ලැබීම් බැංකුවේ තැන්පත් කොට චෙක්පත් වලින් පමණක් ගෙවීම් කරයි. මෙම ව්‍යාපාරය පොදු ලෙජරය තුල පාලන ගිණුම් පවත්වා නොගනී. 2021 අප්‍රේල් මාසයේ දී සිදුවූ ලැබීම් හා ගෙවීම් ගනුදෙනු පහත දැක්වේ.**

- **4/1 රු.20,000 ක ඉන්වොයිස් මිල වූ ද්‍රව්‍ය අත්පිට මුදලට ගත්තා.**
- **4/3 රු.30,000 ක ඉන්වොයිස් මිල වූ භාණ්ඩ අත්පිට මුදලට විකුණුවා.**
- **4/5 අමාලිගෙන් 20000 ක් සඳහා 10% ක වට්ටමකට යටත්ව චෙක්පතක් ලැබුනා.**
- **4/8 සහන්ගෙන් 10000 ක් සඳහා 5% ක වට්ටමකට යටත්ව චෙක්පතක් ලැබුනා.**
- **4/10 කුසල්ට රු.10000 ක ණය මුදල සඳහා චෙක්පතක් නිකුත් කළා.**
- **4/12 රු.80000 ක් මිල වූ කාර්යාල උපකරණ මිලදී ගෙන චෙක්පතකින් ගෙව්වා.**
- **4/13 රු.4000 ක් ජල බිල්පත සඳහා ගෙව්වා.**
- **4/15 විකුණුම් මිල වූ රු.40 000 ක භාණ්ඩ විකුනා චෙක්පතක් ලබා ගත්තා.**
- **4/23 රු.5,000 ක කොමිස් ආදායමක් ලැබුනා.**
- **4/25 රු.12 000 ක කුලී ගෙව්වා.**
- **4/27 සහන්ගෙන් රු.25,000 ක ණය සඳහා 12% ක වට්ටමකට යටත්ව චෙක්පතක් ලැබුනා.**
- **4/28 නිර්මලාට රු.16,000 ක ණය සඳහා 10% ක වට්ටමකට යටත්ව ගෙවීම් කළා.**
- **4/29 4.10 දින කුසල්ට නිකුත් කළ චෙක්පත අගරු වූ බව ඔහු විසින් දන්වා එවා තිබුනා.**
- **4/30 සහන්ගෙන් 4.27 දින ලැබුනු චෙක්පත අගරු වී ඔහුට ආපසු යැව්වා.**
- **මෙම ව්‍යාපාරයේ අප්‍රේල් 01 දිනට බැංකු ශේෂය රු.112,000 කි.**

**අවශ්‍ය වන්නේ,**

**I. විශ්ලේෂණ තීරු සහිතව ලැබීම් ජ'නලය සහ ගෙවීම් ජ'නලය**
**II. පොදු ජ'නලයේ අදාල සටහන්**
**III. අදාල ලෙජර් ගිණුම්**

**11.නිමල්ගේ ව්‍යාපරය VAT සඳහා ලියපදිංචි වූ ව්‍යාපාරයකි.ඔහුගේ ව්‍යාපාරයේ 2023 අප්‍රේල් මස සිදුවූ ලැබීම් හා ගෙවීම් විස්තර පහත පරිදි වේ.ගැනුම් හා විකුණුම් වටිනාකම් ලෙසදී ඇත්තේ VAT ඇතුලත් නොවූ මිලයි. VAT අනුපාතය 10%කි.**

- **4/1 රු.200 000 ක් මුදලින් රැගෙන ආවා.**
- **4/5 අත්පිට විකුණුම් වලින් ලැබීම් රු. 50000.**
- **4/7 අත්පිට ගැනුම් සඳහා රු. 20000 ක් ගෙව්වා .**
- **4/10 රු. 5000 ක් කුලී අදායමක් ලැබුනා.**
- **4/12 රු.60000 ක ණය ගැතියෙකුගෙන් 10% ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණා.**
- **4/14 රු.7000 ක විදුලි වියදම් ගෙව්වා.**
- **4/16 ණයහිමියෙකුට රු.20000 කණය සඳහා 10% ක වට්ටමකට යටත්ව මුදල් ගෙව්වා .**
- **4/18අත්පිට විකුනුම් වලින් රු. 30000 ක් ලැබුණා .**
- **4/20ණයගැතියන්ගෙන් රු.40000ක ණය සඳහා 10% ක වට්ටමකට යටත්ව මුදලින් ලැබුනා .**
- **4/22 අත්පිට ගැනුම් සඳහා රු.25000ක් ගෙව්වා.**
- **4/25 රු. 2000 ක දුරකතන ගාස්තු ගෙව්වා.**
- **4/26 බැංකු ගාස්තු ලෙස රු.1000 ක් බැංකුව අය කරගත්තා.**
- **4/30 අත්පිට විකුණුම් රු. 40000 යි.**

**I. ලැබීම් හා ගෙවීම් ජ'නල් පිලියෙල කර ගනුදෙනු ලෙජරයට පිටපත් කරන්න.**

DEEPTHA EKANAYAKA